ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2007 අංක 18 දරන රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනම(සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2007** මැයි මස **08** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 මැයි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 05, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 6.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2007 අංක 18 දරන රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 මැයි මස 08 වන දින]

එල්.ඩී.—ඕ.— අයි. එන්. සී. 15/2004.

### රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව එකී සංගමය සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස කරගෙන යාම සහ ඉටුකිරීම සඳහා මෙතෙක් කල් මහනුවර පිහිටුවාගෙන තිබුණු හෙයින් ද :

එකී සංගමය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, ඒ සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම්කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ලබා දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2007 අංක 18 දරන රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනමෙහි සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපිත කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එම නමින් සංස්ථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද, සියලු අධිකරණවල නඩු පැවරිය හැකි වන්නේ ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. රඹුක්වැල්ලේ ශ්‍රී විපස්සී සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

2-PL 001673 - 3,100 (2006/12)

(අ) දුප්පත් බෞද්ධ සිසුන්ගේ ශාස්ත්‍රීය හා ආගමික අධ්‍යාපනය නංවාලීමට සහ ඔවුන්ගේ විවිධ කුසලතා දියුණු කිරීමට කටයුතු සම්පාදනය කිරීම ;

(ආ) බෞද්ධයන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, දහම් පාසල් පවත්වාගෙන යාම, පුස්තකාල, බෞද්ධ තොරතුරු හා පර්යේෂණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සහ විද්‍යුත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම ;

(ඇ) බෞද්ධ ජනතාවගේ කායික හා මානසික සුවය වර්ධනය කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට අවශ්‍ය ආර්ථික සහන සැලසීම ;

(ඈ) අසරණ සරණ සේවා සැපයීම හා වැඩිහිටි නිවාස හා විශ්‍රාම ශාලා පවත්වාගෙන යාම ;

(ඉ) රැකියා නොමැති බෞද්ධයන්ට රැකියා අවස්ථාවන් ඇති කරලීම සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ඒ කාර්ය සඳහා ආධාර පහසුකම් සහ වෙනත් ණය පහසුකම් ලබා දීම ;

(ඊ) රැකියා ලබාගැනීමේ පහසුව සඳහා හැකියාවන් දියුණු කිරීම පිණිස වෘත්තීය පුහුණු පාඨමාලා සංවිධානය කිරීම ;

(උ) කර්මාන්ත සඳහා ආධාර උපකාර කිරීම හා පාරම්පරික බෞද්ධ සිද්ධස්ථාන වන්දනාමාන කිරීම සඳහා ප්‍රදේශ හරහා ගමන් කරන බෞද්ධ බැතිමතුන්ගේ පහසුව සඳහා විශ්‍රාම ශාලාවක් පවත්වාගෙන යාම ; සහ

(ඌ) ඉහත ඡේදයේ සඳහන් පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, 5 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන නිලධරයන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, පදනමේ ආරම්භක සභාපති වූ පූජ්‍ය රඹුක්වැල්ලේ විපස්සී හිමි සංස්ථාවේ ප්‍රථම සභාපති විය යුතු ය.

(3) රඹුක්වැල්ලේ විපස්සී මහනාහිමියන්ගෙන් පසුව සභාපති ධුරය හිස් වූ විට සාමාජික මණ්ඩලයේ දෙවන සාමාජික හිමියන් සභාපති ධුරයට පත්විය යුතු අතර, රඹුක්වැල්ලේ සංඝ පරම්පරාවේ ඊළඟට සිටින ප්‍රධාන ශිෂ්‍යයා සාමාජික මණ්ඩලයේ දෙවන සාමාජිකයා බවට පත් විය යුතු ය.

(4) පැවිදි සාමාජිකයෙක් උපැවිදි වුවහොත් ඔහුට එම සාමාජිකත්වය අහිමි වන අතර, එවැනි අවස්ථාවක රඹුක්වැල්ල සංඝ පරපුරේ ඊළඟ ශිෂ්‍යයාට එම අවස්ථාව හිමි වන්නේ ය

**5**. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ ඇතුළත් කර ගැනීම, සාමාජිකයන් ඉල්ලා අස්වීම සහ නෙරපීම ;

(ආ) නිලධාරීන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ධුරය අත් හැරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ;

(ඇ) සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ එහි බලතල, කර්තව්‍ය, කාර්ය සහ සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඈ) සභාව රැස්වීමේ දී පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම පැවැත්වෙන වේලාවන්, ස්ථාන, දැන්වීම්, ගණපූරණය සහ න්‍යාය පත්‍රය සහ එහි රැස්වීම් කටයුතු පැවැත්වීම ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද රීති (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සියලු කල් හි දී සංස්ථාවේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**6**. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, එහි මුදල් වර්ෂය සෑම වර්ෂයකම ජනවාරි මස 1 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතු ය.

(2) සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්ථවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, සභාව විසින් අනුමත කරනු ලබන බැංකුවක සංස්ථාව නමින් තැන්පත් කළ යුතු අතර, එම මුදල් සභාව තීරණය කරනු ලබන අවස්ථාවක ඉතිරි කිරීම් හෝ ජංගම ගිණුමක ද තැන්පත් කළ හැක්කේ ය.

පදනම විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

**7**. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපිත කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය හෝ අයවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල් මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

**8**. (1) සංස්ථාවේ ආදායම් හා වියදම් පිළිබඳව ද වත්කම් හා බැරකම් පිළිබඳව ද වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් ද යථා පරිදි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු විය යුතු සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9**. යම් මිලට ගැනීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් ප්‍රතිලාභී අයිතිකරු වශයෙන්, භාරකරු වශයෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට සහ ඒ දේපළට අදාළ භාර ඔප්පුවේ විධිවිධානවලට හා කොන්දේසිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ හෝ යටත් කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10**. සංස්ථාවේ රීති මගින් සලස්වා ඇති පරිදි වූ යම් නිලධරයන් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන්, ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් තැබිය යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට බාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11**. ශ්‍රී ලංකා ජනරජයේ, යම් රාජ්‍ය හෝ සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, පොල්හේන්ගොඩ පාර, කිරුළපන, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේතුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.